High Commission of the Democratic Socialist Republic of
333, Laurier Avenue West, Suite #1204 Ottawa, Ontario K1P 1C1
Tel: (613) 233-8449 Fax: (613) 238-8448 Email: slhcit@rogers.com
www.Srilankahcottawa.org

2020 ජූනි මස 02 වෙනි දින

ප්‍රධාන කර්තෘ
දිවයින පුවත්පත
උපාලි ප්‍රවෘත්ති පත්‍ර පෞද්ගලික සමාගම
කොළඹ.

**2020 ජූනි මස 02 අඟහරුවාදා දිවයින E-PAPER හි පළ වූ "කොටි ක්‍රියාකාරිකයාගේ පනත කැනඩා පාර්ලිමේන්තුවේ දී සම්මත වේ" යන පුවත සම්බන්ධයෙනි.**

2020 ජූනි මස 02 වෙනි දින "දිවයින" පුවත්පතේ දෙවන පිටුවේ කීර්ති වර්ණකුලසූරිය මයා නමින් පළවූ උක්ත පුවත සාවද්‍යය.

කැනඩාවේ ඔන්ටාරියෝ පාර්ලිමේන්තුවට 2019 මැයි මස 16 දින ඉදිරිපත් කරන ලද මෙම පණත දෙවන වර කියවීමේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 59කගේ ඡන්දයෙන් සම්මත වුවද එය පෞද්ගලික පණතක් මිස (Private Bill) සාමූහික පණතක් නොවේ. එසේම එය අද දක්වා නීතියක් බවට පත්වී නොමැත.

කැනඩා පාර්ලිමේන්තු ක්‍රමවේදය අනුව මෙම පෞද්ගලික පණත නීතියක් බවට පත්කරලීම සඳහා ඉදිරි පියවර ගණනාවක් ගත යුතු වේ. එසේ හෙයින් 2019 මැයි 16 දින සිට මෙම පණත රෙගුලාසි සහ පෞද්ගලික පණත් පිළිබඳ කාරක සභාව (Standing Committee on Reputations and Private Bills) වෙත යොමුකොට ඇත. පුද්ගලික පණතක් සම්මතවීම පිණිස තුන්වන වර කියවීමෙන් අනතුරුව පළාත් අග්‍රාණ්ඩුකාරවරියගේ අනුමැතිය ද ලබාගත යුතුවේ. මෙම පණත සම්බන්ධයෙන් මෙවැනි ඉදිරි පියවර කිසිවක් ගෙන නොමැත.

මෙම පණත නීතියක් බවට පත්වීම වැළැක්වීම උදෙසා ශ්‍රී ලංකා විදේශ සබඳතා අමාත්‍යාංශය, කැනඩාවේ ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය, ටොරොන්ටෝ හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය, ශ්‍රී ලංකා ප්‍රජා සංවිධාන සහ කැනඩාවේ ශ්‍රී ලංකා වෘත්තීමය සංවිධාන ක්‍රියාශීලිව සහ අඛන්ඩව රාජ්‍ය තාන්ත්‍රික සහ වෘත්තිය මට්ටමින් කැනඩාවේ ඉහල දේශපාලන බලධාරීන්, කැනඩාවේ මහජන නියෝජිතයන් සහ අදාල නිළධාරීන් පුළුල්ව දැනුවත් කොට ඇත. මෙම පණත ඉන් ඉදිරියට ගෙන යාමක් නොමැති හෙයින් එය නීතියක් බවට පත්වීම මේ වන විට අඩාල වී ඇත.

මෙම පණතට එරෙහිව ගනු ලබන සාමූහික ක්‍රියාමාර්ග අඛණ්ඩව ඉදිරියටත් පවත්වාගෙන යන බව දන්වා සිටීමට කැමැත්තෙමි.

මෙම පණත මෙතෙක් සම්මතවී නොමැති හෙයින් මෙම සාවද්‍ය පුවත නිවැරදි කර, උක්ත පුවතට ලැබුණු ප්‍රසිද්ධියම ලැබෙන සේ ඔබ පුවත් පතේ පළ කරන මෙන් ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිමි.

**එම්.ඒ.කේ. ගිරිහාගම**
**ශ්‍රී ලංකා මහකොමසාරිස්**